


## ஃ මිනිසාගේ නැණ සවිය මතු කරන බෞද්ධ අධ්‍යාපනය

– දයා රෝහණ අතුකෝරළ

මිනිස් මනසෙහි සැඟවී පවත්නා විවිධ කුසලතා ශක්ති උද්දීපනය කොට ජීවන විමුක්තිය උදාකර ගැනීම මූලාර්ථය කොටගත් බෞද්ධ අධ්‍යාපන ක්‍රමවල සුවිශේෂත්වය පිළිබඳ විමර්ශනයකි.

## ஃ නිවන් මඟ පැහැදිලි කරන සාමඤ්ඤඵල සූත්‍රය

– දම්පහළ ධම්මාරාම හිමි

ලෝකයෙන් එතෙරවීම සොයා යන ගවේෂණශීලී ආර්ය ප්‍රතිපදාව විමර්ශනය කිරීම සඳහා පදනමක් ලෙස යොදා ගත හැකි 'සාමඤ්ඤඵල' නම් වූ බුදු මුවින් දේශිත සූත්‍රයට අර්ථ විවරණයකි.

## ஃ දෙස් – විදෙස්හි නැණ පහන් දැල්වූ බොදු සරසවිය නාලන්දාව

– සිරිසමන් විජේතුංග

සම්මත සෑම තරාතිරමකටම අයත් සමාජ කොටස්වලට පොදුවේ විවෘත වී අධ්‍යාපන ක්‍රමයක් වූ විශ්ව විද්‍යාල අධ්‍යාපන ක්‍රමය මුලින්ම ලොවට හඳුන්වා දුන් පැරණි බෞද්ධයන් විසින් අරඹන ලද භාරතයේ ඓතිහාසික 'නාලන්දා' නම් වූ මහා බෞද්ධ විශ්ව විද්‍යාලය පිළිබඳ විස්තර ඇතුළත් 'බෞද්ධ භාරතය' නම් වූ විශේෂාංගය යටතේ පළවන ලිපියකි.

## ஃ දෙලොව දියුණුවට හේතු වන මිතු දම් බුදු හිමි දුටු සැටි

– ආනමඩුවේ ධම්මරතන හිමි

මිතුරු ඇසුර පුද්ගලයාගේ දියුණුවට හා පරිහානියට හේතු වන අයුරු. ජීවිතයේ දියුණුවත් – සදාචාර වර්ධනය හා පුද්ගල විමුක්තියත් ලැබීම සඳහා මිතුරන් නිවැරැදිව හඳුනාගැනීමට බුදු වදනෙන් පෙන්වා දී ඇති මිනුම් දඬු.

## ஃ අධර්මය – ධර්මයෙන් දුරු කිරීමේ බෞද්ධ ප්‍රතිපත්තිය

– රෙජී වීරමන්

ජීවිතය පිළිබඳ සහ නිවැරැදි ජීවන පිළිවෙත පිළිබඳ සෙවීමට ගොස් විවිධ දෘෂ්ටි සහිතව සිටි උගතුන්ගෙන් පිරුණු – දර්ශනික වශයෙන් විප්ලවීය සමාජ පසුබිමක පහළ වූ බුදුරදුන් සාමකාමී ලෙස සත්‍ය වූ ධර්මය ඔවුනට පහදා දුන් අයුරු. මිථ්‍යා දෘෂ්ටිකයන් – සම්‍යක් දෘෂ්ටිකයන් බවට පත් කළ දැහැමි බෞද්ධ සංනිවේදන උපක්‍රම.

## ஃ මිහින්තලාව පුද බිම රැක ගනිමු පූජනීය බව හා ගෞරවය සුරකිමු

– කතුවැකිය

## ஃ නිරෝගී මනස රෝගී කරවන පංච කාම සම්පත්තිය

– තෙළඟපාත ධර්මකීර්ති නා හිමි

පස්කම් සැපතට අධික ලෙස ලොල් වීම – යහපත් මානසික සෞඛ්‍යයක් පවත්වා ගැනීමට බාධකයක් වන අයුරු. කාමාශ්වාදය පිළිබඳ තණ්හාව – විවිධ සමාජ ගැටලු සහ ගැටුම්වලට මූල හේතුවක් වන අයුරු.

## ஃ තමන්ටම සතුරුකම් කරන මිනිස්සු

– දිවියාගහ යසස්සි නා හිමි

ධර්මාවබෝධය නොමැතිකම නිසා විවිධ පාප කර්ම සහ දුශ්චරිතවල නියැළෙමින් – තමන්ගේ කර්ම ශක්තිය දුබල කර ගනිමින් – තමන්ගේම සතුරකු ලෙස හැසිරෙන මිනිසුන්ගේ ක්‍රියා කලාපය ගැන බුදුරදුන් ඉදිරිපත් කළ ධර්මානුකූල විග්‍රහයකට අර්ථකථනයකි. 'සාර්ථක ජීවිතයකට ධම්මපදයෙන්' විශේෂාංගය යටතේ පළවන කුඩා ලිපියකි.

## ෴ මල්ලී, නංගී දුවේ, පුතේ; මේ ඇමතුම ඔබටයි

– කිරිබත්ගොඩ ඤාණානන්ද හිමි

ළමා සහ තරුණ වියේ සිටින දරුවන්ට – තමන්ගේ දියුණුව සඳහා වැඩිය යුතු නිවැරැදි පිළිවෙත් කිහිපයක් හඳුන්වා දෙන දහම් ඔවදන් ඇතුළත් කුඩා ලිපියකි. විවිධ විෂය කරුණු – සමාජ ගැටලු – දහම් ගැටලු ආදිය පිළිබඳ සුප්‍රකට ධර්මධර හිමිනමකගෙන් විමසා සකස් කැරෙන ලිපි පෙළක පළමුවැනි ලිපිය. 'ධම්ම චින්තා' නමින් මෙම විශේෂාංගය නම්කර ඇත.

## ෴ Vedabbha Jatakaya

-by Dr. S.G. Samarasinghe Of Samskrti Research e-mail samskriti@sltnet.lk

## ෴ වාර්ගික අර්බුදයට විසඳුම් සෙවීමේදී බුදු දහමෙන් ලැබිය හැකි මඟ සුවිශේෂයි

ලේක්හවුස් මිහින්තලා ආලෝක පූජා පින්කමට ජනාධිපතිතුමිය එවූ පණිවිඩය

## ෴ මිහිඳු මාහිමියන් ගෙන ආ සංස්කෘතික දායාදවල ආභාෂය ලබාගෙන කැඩී ගිය රට ගොඩනඟමු

– අගමැති මහින්ද රාජපක්ෂ

ලේක්හවුස් ආයතනය මඟින් පොසොන් උත්සවය නිමිති කරගෙන මිහින්තලා පූද බිමේදී හතළිස් දෙවැනි (42) වරටත් පැවැත්වූ ආලෝක පූජා පින්කම පිළිබඳ ප්‍රවෘත්ති වාර්තා දෙකකි.